**තණමල්විල ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 18 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 ඔක්තෝබර් 17 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයේ ඌණතාවය වූ රු.3,133,817 ක් ලෙජරයේ සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ආ) සෙවණගල උප කාර්යාල ඉඩම හා ගොඩනැගිල්ල සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යන ඉඩම් සහ ගොඩනැගිලි සමාලෝචිත වර්ෂයේදීද තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පුස්තකාල පරිග්‍රහණ ලේඛන අනුව පොත් 689 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් රු.6,126,616 ක් ගිණුමෙහි රු.4,667,983 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.1,458,633 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයන් 07 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.67,559,705 ක් වූ අතර, ලේඛන අනුව ශේෂය රු.2,422,337 ක් විය.

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදලේ ශේෂය රු.62,620 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදීත් එම ශේෂය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1995 - 1999, 2001 - 2007 සහ 2011 - 2012 වර්ෂයන් සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු.293,531 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

1.3.4 <u>ලැබිය යුතු ගිණුම්</u>

නිලධාරින් 17 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින රු.125,704 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,287,926 ක් වූ වත්කම් විෂයන් 02 ක් හා රු.49,586,756 ක් වූ වගකීම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති ,රීති ආදියට අනුකූල නොවීම

-----------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුවසමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.28,477,205 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,262,570 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,276,411 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 2,986,159 ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>බදු ආදායම්</u>**

තණමල්විල පොදු වැසිකිළිය, කිරිඉබ්බන්වැව පැල තවාන ඩංඩුම ගවමස් කඩය සහ තණමල්විල ගවමස් කඩය සහ සභා දේපල සමාලෝචිත වර්ෂයේදීද බදු දීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **<u>වෙළඳ බලපත්‍ර ගාස්තු</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(i) වගන්තිය ප්‍රකාර වෙළඳ බලපත්‍ර ගාස්තු ප්‍රමාණයන් තීරණය කර වාර්ෂිකව ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 **<u>වෙනත් ආදායම්</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයක් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් 01 ක් සහ ලැගුම්හල් 1 කින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | <u>රු.</u> |
|---|---|
| උසාවි දඩ | 1,834,047 |
| මුද්දර ගාස්තු | 86,450 |

2.5 **<u>අධිභාර</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.672,220 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) සභාව සතු වාහන 05ක මයිලෝමීටරය අක්‍රීය වී තිබූ නිසා ධාවනය කළ දුර හා භාවිතා කළ ඉන්ධන ප්‍රමාණය පිළිබඳ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සභාව සතු පාවිච්චියට ගත නොහැකි වාහන 03 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබූ අතර, මේ සම්බන්ධව ජනාධිපති ලේකම්ගේ අංක PCMD/PR/2013 හා 2013 ජූනි 05 දිනැති ලිපියෙහි විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. **<u>ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය</u>**

**<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය